# ශ්‍රී ලංකා නීති විද්‍යාල සාමාන්‍ය ප්‍රවේශ විභාගය 2023

ශ්‍රී ලංකා නීති විද්‍යාල සාමාන්‍ය ප්‍රවේශ විභාගය සඳහා අයදුම්පත් යොමු කළ අයදුම්කරුවන්ගේ විශේෂ අවධානය පිණිසයි.

1. 2023 සැප්තැම්බර් මස 30 වන දින පැවැත්වීමට කටයුතු සැලසුම් කොට ඇති ඉහත විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා විභාග ප්‍රවේශ පත්‍ර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් විභාගයට දින 10 කට පෙර නිකුත් කරනු ලැබේ.

2. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය ඔස්සේ අදාළ ප්‍රවේශ පත්‍ර බාගත කළ හැක. (www.doenets.lk)

3. විභාග ප්‍රවේශ පත්‍ර සම්බන්ධ ගැටලු ඇතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසීම් කළ හැක. (දුරකථන අංක - 011-2785230/011-2786150)

4. ඉහත විභාගය සඳහා යොමු කළ අයදුම්පත්, ප්‍රතික්ෂේප වී ඇති අයවලුන් සඳහා පමණක් මේ වන විටත් විද්‍යුත් තැපැල (E-Mail) මගින් දැනුවත් කිරීම් සිදුකොට ඇත. ඒ සම්බන්ධයෙන් යම් විමසීමක් වෙතොත් 2023.09.22 දිනට පෙර දුරකථන අංක - 070-6759892 ඔස්සේ නීති විද්‍යාලයේ නීති ප්‍රවේශ අංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

5. 2022 අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිට, අයදුම්පත් යොමු කරන අවස්ථාවේදී සිය ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට නොහැකි වූ අයදුම්කරුවන් කඩිනමින් සහතික කරන ලද තම ප්‍රතිඵල ලේඛනය ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීති ප්‍රවේශ අංශය වෙත පැමිණ භාර දිය යුතු වේ.
   (මේ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් බාගත කරන ලද ප්‍රතිඵල ලේඛනය ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ).

6. ඉහත 05 කරුණට අදාළව තම ප්‍රතිඵල තහවුරු කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් නීති ප්‍ර වේශ විභාගයේ ප්‍රතිඵල නිකුත් කරන අවස්ථාවේදී සුදුසුකම් නොලද අපේක්ෂකයින් ලෙස සලකා කටයුතු කිරීමට සිදුවනු ඇත. තව ද එවැනි අපේක්ෂකයින් ශ්‍රී ලංකා නීති විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබනු ඇත.

විදුහල්පති<br>
ශ්‍රී ලංකා නීති විද්‍යාලය<br>
2023.09.12